සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය (88) - I කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පහත ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) ඇඳීම යනු ප්‍රස්ථාරික භාෂාවකි.
    (2) ඇඳීම විශ්ව භාෂාවකි.
    (3) ඇඳීම කාර්මික ඇඳීම සඳහා පමණක් භාවිත කරන භාෂාවකි.
    (4) ඇඳීම සාමාන්‍ය ජනතාව එදිනෙදා කටයුතු සඳහා භාවිතා කරයි.

02. නිවැරදි වාක්‍ය තෝරන්න.
    (1) අඟලකින් 8 න් පංගු දශම නමින් හඳුන්වයි.
    (2) අඟලකින් 10 න් පංගු නූල් නම් වේ.
    (3) අඟලකින් 8 න් පංගු නූල් නමින් හඳුන්වයි.
    (4) අඟලකින් 8 න් පංගු කාල් නමින් හඳුන්වයි.

03. පරිමාණය යන පදය සැබෑ වස්තුවේ ප්‍රමාණය හෙවත් තරම අඳින ලද එම වස්තුවේ චිත්‍රයේ ප්‍රමාණය/තරම අතර ඇති අනුපාතය ලෙස අර්ථ දක්වයි. මේ අනුව අනුපාතයකට කාර්මික චිත්‍රයක් අඳින ක්‍රම කීයද?
    (1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

04. තෙවන කෝණ ප්‍රක්ෂේපණ සඳහා භාවිතා කරන නිවැරදි සංකේතය කුමක් ද?

(1)


(2)


(3)


(4)


05. තාක්ෂණික ඇඳීම් වලදී භාවිතා කරන පැන්සල් වර්ග 03 නම් කරන්න.
    (1) 2H, H, 2B (2) 2H, H, HB (3) 2H, H, F (4) H, HB, 2B

06. සිග් සැග් ලකුණු (  ) භාවිතා කරන්නේ,
    (1) නිශ්චිත දිගක් දික් කර පෙන්වීමටය. (2) දිගක් කෙටි කර පෙන්වීමටය.
    (3) වස්තුවක පළල පෙන්වීමටය. (4) වස්තුවක උස පෙන්වීමටය.

07. කේතුවක් සිරස් තලයට සමාන්තරව කැපූ විට දක්නට ලැබෙන රූපය හඳුන්වන්නේ,

(1) පරාලවලය (2) බහුවලය (3) වෘත්තය (4) ඉලිප්සය

08. බිත්ති මුල්ලක් ($90^0$) ගෙබිම මත පිහිටුවා ගැනීමට අවශ්‍ය වූ විට පාදවල දිග අතර අනුපාතය වන්නේ,

(1) 1 : 2 : 3 (2) 2 : 3 : 4 (3) 2 : 2 : 4 (4) 3 : 4 : 5

09. කියවීමකට ඇති දුර ක් නම් පරිමාණ භාගය 20 : 1 වූ විට චිත්‍රය මත අඳින දුර කොපමණ ද?

(1) 80mm (2) 40mm (3) 20mm (4) 100mm

10. මෙම රූපයේ පිළිවෙලින් A, B, C වනුයේ,




(1) ඇණ කට්ටය, ඇණ කර, ඇණ කඳ

(2) ඇණ කට්ටය, ඇණ හිස, ඇණ කඳ

(3) අන්තරාලය, ඇණ හිස, ඇණ කඳ

(4) ඇණ පොට, ඇණ හිස, ඇණ කඳ

11. පහත දැක්වෙන අමුද්‍රව්‍ය අතුරින් භංගුරතාවය (Brittleness) අධිකව වූ ලෝහ වර්ගය කුමක් ද?

(1) මැටි (2) තඹ (3) මෘදු වානේ (4) ඊයම්

12. ද්‍රව්‍යවල පවත්නා ගුණ අතරට අයත් නොවන්නේ,

(1) යාන්ත්‍රික ගුණ (2) තාපීය ගුණ (3) ශිල්පීය ගුණ (4) රසායනික ගුණ

13. රබර් නැමැති අමුද්‍රව්‍යයේ වැඩි වශයෙන් පවතින ගුණය වන්නේ,

(1) තන්‍යතාව (2) සුවිකාර්යතාව (3) විරූපණය (4) ප්‍රත්‍යස්ථතාව

14. පහත දැක්වෙන දැව වර්ග අතුරින් තද දැවයක් හා මෘදු දැවයක් පිළිවෙලින් සඳහන්ව ඇති පිළිතුර වන්නේ,

(1) බුරුත, ගිනිසපු (2) ලුණුමිදෙල්ල, ගිනිසපු

(3) ගිනිසපු, බුරුත (4) ගිනිසපු, කොස්

15. දැව කඳක මේරූ වැඩට ගත හැකි කොසට හඳුන්වන්නේ,

(1) එලය (2) හරඩුව (3) අරටුව (4) වජ්ජා කිරණ

16. නිර්මාණ සැකසීමට නිර්මාණකරුවාට ද්‍රව්‍යවල දැනගත යුතු වඩා වැදගත්ම කරුණ වන්නේ,

(1) ද්‍රව්‍යවල මූලික ගුණ දැනගැනීමයි. (2) ද්‍රව්‍යවල මිල දැනගැනීමයි.

(3) ද්‍රව්‍යවල වෙළඳ නාම දැනගැනීමයි. (4) ද්‍රව්‍යවල සුලබත්වය දැනගැනීමයි.

17. ශ්‍රී ලංකාවේ හා ඊජිප්තුවේ දක්නට ඇති පැරණි ඉදිකිරීම් දෙකකට උදාහරණ වන්නේ,

(1) සමාධි බුදු පිළිමය හා කාලිකට් වරායයි.

(2) රුවන්වැලිසෑය හා පිරමීඩයි.

(3) නෙළුම් කුළුණ හා පිරමීඩයි.

(4) රුවන්වැලිසෑය හා අශෝක ස්ථම්භයි.

18. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් වීමට බලපා ඇති හේතුව වන්නේ,

(1) විද්‍යාත්මක සංකල්ප ඉදිරිපත් කිරීමයි. (2) ඇතිවන අවශ්‍යතා සංකීර්ණ වීමයි.

(3) දැනුම සොයා යාමට ඇති ආශාවයි. (4) ඉහත සියල්ලමයි.

The National e-learning Portal for The General Education

19. කළුගල් නැමැති අමුද්‍රව්‍ය පමණක් භාවිතා කරමින් සකසන ලද පැරැණි ඉදිකිරීමකි,

(1) සමාධි බුදු පිළිමය (2) රුවන්වැලි මහා සෑය

(3) ලෝවාමහාපාය (4) ඉහත සියල්ලම වේ

20. රට තුළ භූමිය හාරා සකසන ලද ඉදිකිරීමක් වන්නේ,

(1) කොළඹ වරාය (2) හම්බන්තොට වරාය

(3) ත්‍රිකුණාමලය වරාය (4) කොළඹ වරාය නගරය

21. නොකැඩී තිබෙන හොඳ ගඩොලක් දැයි පරීක්ෂා කිරීමට කිනම් උසක සිට ගඩොලක ඔළු මුහුණත පැත්ත පතිත වන සේ බිමට අතහැරිය යුතුද?

(1) 2m (2) 3m (3) 1.5m (4) 1m

22. ඉහළ ප්‍රමිතියෙන් යුත් කොන්ක්‍රීට් නිපයුම් සකස් කරගැනීමට සලකා බැලිය යුත්තේ,

(1) සමාහාරවල ප්‍රමිතිය පිළිබඳව. (2) කොන්ක්‍රීට් මිශ්‍රණයේ අනුපාත පිළිබඳව.

(3) සුසංහසනය කිරීම පිළිබඳව. (4) ඉහත සියල්ලම පිළිබඳව.

23. දැව සහ දැව වල කොටස් යොදාගෙන නිපදවනු ලබන දැව හඳුන්වන්නේ,

(1) මිශ්‍ර දැව ලෙස (2) කෘත්‍රිම දැව ලෙස

(3) නවීණ දැව ලෙස (4) ස්වාභාවික දැව ලෙස

24. කෘත්‍රිම දැව වලට අයත් නොවන්නේ,

(1) තුනී ලෑලි (Fly Wood) (2) චිප් බෝඩ් (Chip board)

(3) හාඩ් බෝඩ් (Hard board) (4) ක්ලැඩින් බෝඩ් (Cladding board)

25. කෘමි හා දිලීර හානි වැඩි, කල්පැවැත්මෙන් අඩු හා තෙත් ගතියෙන් යුත් දැව කඳක අභ්‍යන්තර කොටස වන්නේ,

(1) එලය (2) දිය පට්ටය (3) ඇතුළු පොත්ත (4) පිට පොත්ත

26. තුනිවට තනා පණ පෙවූ වානේ විශේෂයකින් නිමවා ඇති මිනුම් උපකරණය වන්නේ,

(1) නමන කෝදුව (2) ලිනන් මිනුම් පටිය

(3) වානේ මිනුම් පටිය (4) වානේ කෝදුව

27. ලීයක යගුගාන ලද පැත්තකට, හුලහකට හෝ දාරයකට සමාන්තරව රේඛාවක් ඇඳගැනීමට භාවිතාකරන උපකරණය වන්නේ,

(1) වරක්කලය (2) මට්ටම් ලෑල්ල (3) ස්වාය මට්ටම් ලෑල්ල (4) අඳින පිහිය

28. නිපදවීම් කටයුතු සඳහා පිරිවිතර උපයෝගී කර ගැනීමෙන්,

(1) නව සොයාගැනීම් සඳහා දායක වේ. (2) වියදම් අඩුකරගත හැක.

(3) කාර්යය පහසු වේ. (4) ඉහත සියල්ලම සිදුවේ.

29. භාවිතයෙන් ඉවත් වෙමින් පවතින ආවුදයක් නොවන්නේ,

(1) අවගාරය (2) රූවට් බුරුමය (3) තට්ටු යත්ත (4) අත් විදුම් යන්ත්‍රය

30. අත් කියත මුවහත් කිරීමට භාවිතා කරන්නේ,

(1) රෝද ගිනිගල (2) තුන් හුලස් පීර (3) රවුම් පීර (4) වැලිගල

31. ආවුද උපකරණ වර්ගීකරණය කිරීමේ දී වඩාත් සුදුසු ක්‍රමය වනුයේ,

(1) ආවුද උපකරණවල හැඩය අනුව වර්ග කිරීමයි.

(2) ආවුද උපකරණවල භාවිතය අනුව වර්ග කිරීමයි.

(3) ආවුද උපකරණවල මිල අනුව වර්ග කිරීමයි.

(4) ආවුද උපකරණවල සුලභතාවය අනුව වර්ග කිරීමයි.

32. ආවුද හා උපකරණ සුවිශේෂ කර දක්වීමට හෝ එවැන්නක් නිවැරදිව හඳුනාගැනීම සඳහා විශේෂ කර දක්වන කරුණු.

(1) පිරිවිතර වේ. (2) නිර්ණායක වේ. (3) ඇගැයීම් වේ. (4) නිපුණතා වේ.

33. නියන භාවිතයේ දී එහි මිටට පහරදීම සඳහා යොදාගන්නේ,

(1) මිටියයි. (2) අතකොළුව (3) අඩු මිටියයි (4) ඉහත සියල්ලමයි

34. ස්නේහනය කිරීම මගින් යන්ත්‍ර කොටස්වල,

(1) උපාංග ගෙවීම අවම වේ. (2) ක්‍රියාකාරීත්වය රළු වේ.

(3) පහසුවෙන් කරකැවීම සිදු නොවේ. (4) ගෙවුණු කොටස් තැන්පත් වීම සිදුවේ.

35. අනතුරු ඇතිවීමට බලපාන සාධකයක් නොවන්නේ,

(1) විදුලි කාන්දුවීම (2) නොදනුවත්කම

(3) යාන්ත්‍රික දෝෂ (4) සැලකිලිමත් බව හා පිළිවෙළ

36. ආවුද උපකරණ නිෂ්පාදකයින් විසින් නිර්දේශ කර ඇති උපදෙස් පිළිපැදීම මගින්,

(1) පුද්ගල ආරක්ෂාව සැලසේ.

(2) ආවුද උපකරණවලට ආරක්ෂාව සැලසේ.

(3) පුද්ගල ආරක්ෂාව හා ආවුද උපකරණවලට ආරක්ෂාව සැලසේ.

(4) ආවුද උපකරණවලට හා තිපයුම්වලට ආරක්ෂාව සැලසේ.

37. කඳ හතැරැස් ටේපර් හැඩයක් ගන්නා අතර හිස රවුම් පැතැලි වේ. කැන්වස් රෙදි, සම් වර්ග ආදිය ලී වලට සම්බන්ධ කිරීමට භාවිතයට ගන්නා ඇණ වර්ගය වන්නේ,

(1) පනෙල් ඇණ (2) කම්බි ඇණ (3) ටින්ට්ටැස් ඇණ (4) ගිම්ප් ඇණ

38. ඉස්පුරුප්පු ඇණ භාවිතයේ ඇති වාසියකි,

(1) ඉතා හොඳින් කොටස් එකලස්වීම.

(2) සවිකරන ලද කොටස් හානියකින් තොරව නැවත ගලවාගත හැකිවීම.

(3) මෙම ඇණ සවිකිරීමට මිටිය භාවිත කළහැකිවීම.

(4) මෙම ඇණ සවිකිරීමට නියන භාවිත කළහැකිවීම.

39. සවිකුරු සකස් කරගැනීම සඳහා,

(1) වානේ යොදාගනී. (2) තඹ යොදාගනී.

(3) පිත්තල යොදාගනී. (4) ඉහත සියල්ලම යොදාගනී.

40. දොර හා ජනෙල් සවිකිරීම සඳහා විශේෂයෙන් භාවිතාකරන සරනේරු වර්ගයකි,

(1) පෙට්ටි සරනේරු (2) පටි සරනේරු

(3) වවුල් සරනේරු (4) ප්‍රතිවර්ත්‍ය පටි සරනේරු

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**10 ශ්‍රේණිය** | **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II** | **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් තෝරාගත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමි වේ.

---

(01) i. 11cm ක් දිග රේඛාවක් උපයෝගී කර ඒ මත පාද අතර අනුපාතය 3 : 4 : 5 ක් ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න.

ii. අරය 3cm ක් වන වෘත්තයක් තුළ ෂඩාශ්‍රයක් අඳින්න.

(02) i. කොන්ක්‍රීට් යනු කුමක්දැයි පහදන්න.

ii. කොන්ක්‍රීට් ව්‍යුහයක් හොඳින් පදම්වීම නිසා අත්වන වාසි 03 ක් දක්වන්න.

iii. පහත මාතෘකා 02 ක් සඳහා කෙටි සටහන් ලියන්න.

(a) සුසංහසනය

(b) දැව වල ගුණ

(c) ගඩොල් (Bricks)

(03) i. දැව පදම් කිරීම යනු කුමක් ද?

ii. දැව පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම 03 ක් දක්වන්න.

iii. දැව පදම් කිරීමෙන් අත්වන වාසි 04 ක් දක්වන්න.

(04) i. ලඹය නැමැති මිනුම් උපකරණයේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

ii. කිසියම් ඉදිකිරීමක තිරස් බව පරීක්ෂා කිරීමට යොදාගන්නා මිනුම් උපකරණ 03 ක් දක්වන්න.

iii. කුඩා පොත් මේසයක දළ රූප සටහනක් ඇඳ ඊට ගැලපෙන මිනුම් යොදන්න.

(05) ''එදිනෙදා ගෙදර දොර කටයුතු සඳහා අත් කියත ප්‍රයෝජනවත් ආවුදයකි.''

i. අත් කියතක රූප සටහනක් නිදහස් අතින් ඇඳ එහි කොටස් නම් කරන්න.

ii. ලී ඉරීමේ දී අත් කියත ලීය තුළ සිරවීමට ප්‍රධාන හේතුව කුමක් ද?

iii. අත් කියතක් මුවහත් කිරීමේ පියවර දක්වන්න.

(06) ''සෑම කාර්යයක් කිරීමේදී ම අනතුරු සිදුවිය හැකි නිසා ආරක්ෂාවට (Safety) මූලිකත්වයක් දිය යුතුය.''

i. ආරක්ෂාව පිළිබඳ සැලකීමේ දී අවධානය යොමුකළ යුතු ප්‍රධාන කරුණු 03 ක් දක්වන්න.

ii. ඉහත දක්වූ එක් කරුණක් පිළිබඳව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.

iii. ආවුද උපකරණ 05 කට වැඩි ප්‍රමාණයක් රඳවා තැබිය හැකි සෙවණැලි පුවරුවක් (Shadow board) ඇඳ දක්වන්න.

(07) ''ඉදිකිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ දැව නිෂ්පාදනවල කොටස් එකලස් කිරීමට සවිකුරු භාවිතා කෙරේ.''

i. බහුලව භාවිතයට ගන්නා සරනේරු 03 ක් දක්වන්න.

ii. කම්බි ඇණ තැබීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් දක්වන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (3) | 03. (3) | 04. (1) | 05. (2) | 06. (2) | 07. (2) | 08. (4) | 09. (1) | 10. (2) |
| 11. (1) | 12. (3) | 13. (4) | 14. (1) | 15. (3) | 16. (1) | 17. (2) | 18. (4) | 19. (1) | 20. (2) |
| 21. (3) | 22. (4) | 23. (2) | 24. (4) | 25. (1) | 26. (3) | 27. (1) | 28. (4) | 29. (4) | 30. (2) |
| 31. (2) | 32. (1) | 33. (2) | 34. (1) | 35. (4) | 36. (3) | 37. (3) | 38. (2) | 39. (4) | 40. (3) |

## II පත්‍රය

(01) i.




ii.



The National e-learning Portal for The General Education

(02) i. රළු සමාහාර, සියුම් සමාහාර හා බැඳුම් ද්‍රව්‍ය තුන කිසියම් අනුපාතයකට අනුව ජලය සමඟ මිශ්‍ර කර සකස් කරගත් නිෂ්පාදිත ද්‍රව්‍යයකි. (ල.03)

ii. අධික ශක්තිමත් බවත් ලැබීම / කොන්ක්‍රීට් නිපවුම කල්පැවතීම. / මතුපිට පිපිරීම වැලැකේ. / ජල කාන්දුව අවම වේ. / කොටස් ගැල්වී යාම අවම වේ. (ල.03)

iii. ප්‍රමාණවත් විස්තරයක ලකුණු ලබා දෙන්න. (ල.04)

(03) i. දැව වල අඩංගු තෙතමනය ක්‍රමානුකූලව අඩුකර පරිසරයේ ආර්ද්‍රතාවයට සමාන කිරීමයි. (ල.0)

ii. ස්වාභාවික පදම් කිරීම (පවනේ පදම් කිරීම) / පෝරණුවේ පදම් කිරීම (කෘත්‍රිම පදම් කිරීම.) ස්වාභාවික හා පෝරණුවේ පදම් කිරීම (මිශ්‍ර පදම් කිරීම) (ල.03)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

iii. ද්‍රව වල අනවශ්‍ය බර ඉවත් වේ. / ප්‍රමාණවත් ලෙස ශක්තිය වර්ධනය වේ. / වැඩ කිරීමේ හැකියාව වැඩි වේ. / පළුදු හා පුපුරායාමේ හැකියාව අඩුයි. / කල් පවතී. (ල.04)

(04) i. ලඹයෙහි කොටස් දැක්වීම / සිරස් බව පරීක්ෂා කිරීම / භාවිතා කරන අවස්ථාවලට උදාහරණ දැක්වීම යනාදී කරුණු දැක්වීමට. (ල.03)

ii. ස්පීත ලෙවෙලය / ලේසර් ලෙවෙලය / තියර්ඩා ලෙවෙලය / ලෙවෙල් බටය (ල.03)

iii. රූප සටහන ඇඳීමට ලකුණු 02 ක් හා මිනුම් සලකුණු කිරීමට ලකුණු 02 ක් ලබාදෙන්න. (ල.04)

(05) i. රූප සටහන හා කොටස් (මිට / තලය / කියත් දත්) දැක්වීම (ල.03)

ii. කියතේ ප්‍රමාණවත් අයුරින් තෙත්තියත් තබා නොතිබීම. (ල.03)

iii. කියතේ දත් උස් මිටි ගැම. / හැඩය වෙනස් වූ දත් යථා පරිදි හැඩ ගා නැවත සකස් කිරීම. / තෙත්තියත් තැබීම. / මුවහත තැබීම. (ල.04)

(06) i. පුද්ගල ආරක්ෂාව / ආයිත්තම්වීම පිළිබඳ ආරක්ෂාව / කාර්යයන් කිරීමේ ආරක්ෂාව / යන්ත්‍ර භාවිතයේ ආරක්ෂාව / හැසිරීම පිළිබඳව ආරක්ෂාව (ල.03)

ii. එක් කරුණකට අදාළ ප්‍රමාණවත් විස්තරයකට ලකුණු ලබාදෙන්න. (ල.03)

iii. ගැලපෙන රූප සටහනකට ලකුණු ලබානේන. (ල.04)

(07) i. පැතලි සරනේරු / පෙට්ටි සරනේරු / වවුල් සරනේරු / වල්ග සරනේරු (141 පිටුව) (කරුණු 03 කට ල.03)

ii. අවශ්‍ය ප්‍රමාණයේ ඇණ තෝරා ගැනීම. / ඇණ තැබීමේ දී ඇණ කඳ තරමක් ඇඳට සිටින සේ තැබීම. / ඇණ කඳේ මහතට වඩා කුඩා සිදුරක් විද ගැනීම. (135 පිටුව) ( ආදී සුදුස පිළිතුරකට ල.03)

iii. මූට්ටු ශක්තිමත්ව ඇලවීමට හැකියාව / ද්‍රව වලට වෙනත් කොටස් ඇලවීමට / මැලියම් වර්ග දැක්වීම (සත්ව මැලියම් / මාංශ ජනක ධාතුමය මැලියම් / කෘත්‍රිම මැලියම් / රබර් මිශ්‍ර මැලියම්) ආදී කරුණු සඳහා ලකුණු ලබා දෙන්න. (ල.04)